# ලංකා බැංකුව

ලොව ප්‍රමුඛ පෙළේ බැංකු 1000 අතරට ශ්‍රේණිගත කර ඇති, ශ්‍රී ලංකාවේ "අංක 01" රාජ්‍ය වාණිජ බැංකුව වන ලංකා බැංකුව පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් සහ පළපුරුද්ද සහිත පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## සහකාර පුස්තකාලයාධිපති

- ශ්‍රී ලාංකීය පුරවැසියෙකු විය යුතුය.

### ➢ ප්‍රධාන වගකීම්

- ශීඝ්‍රයෙන් වෙනස්වන විද්‍යාත්මක, සමාජයීය හා ආර්ථික පරිසරය තුළ විකාශනය වන තොරතුරු සඳහා ප්‍රවේශය ලබා දීමෙන් පවත්නා පහසුකම් අඛණ්ඩව යාවත්කාලීනකරණය සහ සංවර්ධනයට සහාය වීම හරහා බැංකුවේ ප්‍රගතිය හා සංවර්ධනයට සහාය වීම.
- විශේෂයෙන්ම අන්තර්ජාලය මගින් ප්‍රචලිත කිරීම සඳහා මුද්‍රිත හා විද්‍යුත් තොරතුරු ලබා ගැනීම, කළමනාකරණය හා සුරක්ෂිතකරණය
- තොරතුරු නිමැවුම් හා සේවා සැපයීමේදී බාහිර ප්‍රභවයන්ගෙන් තොරතුරු කාර්යක්ෂමව ප්‍රවේශ කිරීම සඳහා සකච්ඡා කර සංවර්ධන කටයුතු සැලසුම් කිරීම
- කාර්ය මණ්ඩලයට හා කළමනාකාරීත්වය වෙත ඉහත සේවා ප්‍රදානය කිරීම මගින් කාර්යක්ෂම තොරතුරු ඒකකයක් ලෙස ක්‍රියාකිරීමට මධ්‍යම පුස්තකාලය සකස් කිරීම

### ➢ අධ්‍යාපන සුදුසුකම්

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් (ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත) ආර්ථික විද්‍යාව පිළිබඳ ලබාගත් උපාධියක්

**හෝ**

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් (ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත) ආර්ථික විද්‍යාව විෂයක් ලෙස ඇතුළත්ව ලබා ගත් උපාධියක්

**සමග**

- ශ්‍රී ලංකා පුස්තකාලයාධිපති සංගමයේ ආශ්‍රිත සාමාජිකයෙකු වීම

**හෝ**

- පිළිගත් විශ්ව විද්‍යාලයකින් (ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත) පුස්තකාල විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් /පුස්තකාල විද්‍යාව පිළිබඳ උපාධියක්

© THE ASSOCIATED NEWSPAPERS OF CEYLON LTD.ALL RIGHTS RESERVED.

### ➢ පළපුරුද්ද

- සහකාර පුස්තකාලයාධිපතිවරයෙකු ලෙස අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද

### ➢ වයස

- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 40 ට අඩු විය යුතුයි.

### ➢ නියමයන් සහ කොන්දේසි

- මෙම තනතුරු බැංකු සේවයේ සාමාන්‍ය නියමයන් හා කොන්දේසි වලට යටත් වන නමුත් සාමාන්‍ය බැංකු සේවයට පරිබාහිර (සංවෘත සේවය) වේ.
- වසර දෙකක (02) පරිවාස කාල සීමාවකට පසුව තනතුරට යෝග්‍ය යැයි පෙනී ගියහොත් ඔහු/ඇය බැංකු සේවයේ ස්ථිර කරනු ලැබේ.
- තනතුරට අදාළ වැටුප් පරිමාණය

  රු. 49,195/- - රු. 65,995/-

  රු. 840/- X 20

(විචල්‍ය ජීවන වියදම් දීමනාව ඇතුළු සියලු දීමනා සහිත ආරම්භක දළ වැටුප මසකට රු.100,000/- ක් පමණ වේ.)

- අවශ්‍ය වුවහොත් රාජකාරී වේලාවෙන් පසුව, සති අන්ත/නිවාඩු දිනයන්හි සේවය කිරීම අපේක්ෂා කෙරේ.

### ➢ තෝරා ගැනීමේ පටිපාටිය

- සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

### ➢ අයදුම් කිරීමේ පටිපාටිය

අපගේ වෙබ් අඩවිය වන www.boc.lk තුළින් ("Careers" තීරය හරහා) ලබා ගත හැකි ආදර්ශ අයදුම්පත් ආකෘතිය අනුව සැකසූ ඔබගේ අයදුම්පත, උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත, අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල සහ පළපුරුද්ද සනාථ කිරීමේ ලියකියවිලිවල **ඡායාපිටපත්ද** සමග ලියාපදිංචි තැපෑලෙන් **2019 සැප්තැම්බර් මස 02** දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතුය. අයදුම්පත බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ **"සහකාර පුස්තකාලයාධිපති"** යනුවෙන් සඳහන් කළ යුතුය.

**ඉහත සඳහන් අපේක්ෂිත සුදුසුකම් හෝ ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හෝ නියමිත දිනට පසුව එවන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.**

**ප්‍රධාන කළමනාකරු (බඳවා ගැනීම් හා වෘත්තීය සංවර්ධන),**
**මානව සම්පත් අංශය, 26 වන මහල, ලංකා බැංකු ප්‍රධාන කාර්යාලය,**
**"ලංකා බැංකු චතුරශ්‍රය," අංක 1, ලංකා බැංකු මාවත,**
**කොළඹ 01.**

BANK OF CEYLON
BOC
ලංකා බැංකුව இலங்கை வங்கி

*කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීම වහාම නුසුදුසු බවට පත් කිරීමට හේතුවේ.*

*තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවීමේ අයිතිය බැංකුව සතුය.*

Source: Silumina (2019.08.18)